දුරකථන / தொலைபேசி / Telephone ) 0112669192 , 0112675011 ) 0112698507 , 0112694033 ) 0112675449 , 0112675280

ෆැක්ස් / பெக்ஸ் / Fax ) 0112693866 ) 0112693869 ) 0112692913

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் முகவரி / e-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / website ) www.health.gov.lk


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය / எனது இல / My No. ) DDG(MS)1/105/2013

ඔබේ අංකය / உமது இல / Your No. : )

දිනය / திகதி / Date ) 2016/12/16

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

---

චක්‍රලේඛ අංකය : 01 - 71 / 2016

අධ්‍යක්ෂක - සියළුම ශික්ෂණ රෝහල්

අධ්‍යක්ෂක - සියළුම දිස්ත්‍රික් මහ රෝහල්

**<u>ජාතික අක්ෂි බැංකු සේවා සියලුම ශික්ෂණ සහ දිස්ත්‍රික් මහ රෝහල් වෙත ව්‍යාප්ත කිරීම</u>**

"අක්ෂි කුණිත බද්ධය සඳහා අක්ෂි කුණිත සහ රුධිර සාම්පල මෘත දේහයන්ගෙන් ලබා ගැනීම" පිළිබඳ පොදු චක්‍රලේඛ අංක 02-43/2011 ප්‍රකාරව, ජාතික අක්ෂි බැංකුවට ශ්‍රී ලංකා ජාතික රෝහලේ, දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ සහ උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ කටයුතු කිරීමට අවසර ලබා දී ඇත.

අක්ෂි පටක සඳහා ඇති ඉහල ඉල්ලුම හේතුවෙන්, ජාතික අක්ෂි බැංකුව විසින් එහි සේවා රටේ සියළුම ශික්ෂණ රෝහල් සහ දිස්ත්‍රික් මහ රෝහල් වෙත ව්‍යාප්ත කරන ලෙස ඉල්ලා ඇත.

ජාතික අක්ෂි බැංකුව විසින් රටට සිදු කරන සේවයෙහි වැදගත්කම සැලකිල්ලට ගනිමින් බද්ධ කිරීම සඳහා, එකගතාවය ලබා ගැනීමෙන් අනතුරුව මෘත දේහවලින් ජීව්‍ය කුණිත පටක එක්රැස් කිරීමට සහ බෝවන රෝග පිළිබඳ පරීක්ෂා කිරීමට අවශ්‍ය රුධිර සාම්පල ලබා ගැනීමට ජාතික අක්ෂි බැංකු කාර්යමණ්ඩලයට අවසර ලබා දෙන ලෙස මෙයින් උපදෙස් දෙමි.

ඉහත කටයුත්තට සහාය වීම සඳහා පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙස අදාල වාට්ටු කාර්යමණ්ඩලය දැනුවත් කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමි.

1. පුද්ගලයෙකු මරණයට පත්වූ බව තහවුරු වූ පසු, පැය 2ක් ඇතුලත වාට්ටු භාර හෙද නිලධාරිනිය විසින් එකී මරණය පිළිබඳව ජාතික අක්ෂි බැංකුවට දැනුම් දිය යුතුය.
2. හැකි සෑම විටම, වාට්ටු භාර හෙද නිලධාරිනිය විසින් මරණයට පත් පුද්ගලයාගේ ළගම ඥාතියා සහ ජාතික අක්ෂි බැංකු කාර්යමණ්ඩලය අතර සම්බන්ධීකරණය සඳහා කටයුතු සැලසිය යුතුය.
3. මිය ගිය පුද්ගලයාගේ සායනික ඉතිහාසය පිළිබඳ මූලික තොරතුරු ජාතික අක්ෂි බැංකුවට අවශ්‍ය වන්නේ නම් එම තොරතුරු සපයන්න.
4. එක් රැස් කිරීමේ කටයුත්ත ජීවානුහරිතව සිදුකිරීමට සහාය වන්න.
5. මෙම කටයුත්ත සඳහා අමතර කාමරයක් හැකිනම් ලබා දීමට කටයුතු කරන්න.

වෛද්‍ය පී. ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය පී.ජී. මහීපාල
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

---


385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385,வணக்கத்துக்குரியபத்தேகமவிமலவங்சதேரோமாவத்தை,கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.